ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

---

# 2024 අංක 1 දරන ජාතික සමගිය සහ ප්‍රතිසන්ධානය සඳහා වන කාර්යාලය පනත

---

**[සහතිකය සටහන් කළේ 2024 ජනවාරි මස 23 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2024 ජනවාරි මස 26 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකි ය.

**මිල :** රු. 36.00     **තැපැල් ගාස්තුව :** රු. 150.00

මෙම පනත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# 2024 අංක 1 දරන ජාතික සමගිය සහ ප්‍රතිසන්ධානය සඳහා වන කාර්යාලය පනත

[සහතිකය සටහන් කළේ 2024 ජනවාරි මස 23 වන දින]

එල්.ඩී.-ඕ. 16/2023

**ශ්‍රී ලංකාව තුළ ජාතික සමගිය සහ ප්‍රතිසන්ධානය සහතික කිරීම සහ ප්‍රවර්ධනය කිරීම පිණිස ජාතික සමගිය සහ ප්‍රතිසන්ධානය සඳහා වන කාර්යාලය පිහිටුවීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද; එහි බලතල, කාර්ය සහ කර්තව්‍ය දැක්වීම සඳහා සහ ඊට සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකාවේ සමාජ-ආර්ථික සංවර්ධන ක්‍රියාවලිය තුළ ජාතික සමගිය සහ ප්‍රතිසන්ධානය පැවතීමේ අවශ්‍යතාවය සහ වැදගත්කම සහ එය සාක්ෂාත් කරගැනීම සඳහා වන කැපවීම සහ පොදු සම්මුතිය සැලකිල්ලට ගන්නා හෙයින් ද; පූර්විකාව

අනන්‍යතාවය ආරක්ෂා කරමින්, සෑම පුරවැසියකුට ම ආර්ථික, සමාජයීය, සංස්කෘතික සහ දේශපාලන ක්ෂේත්‍රවල සමාන අවස්ථා සහතික කිරීම සඳහා සහ විවිධත්වයට ගරු කරනු ලබන සහ සියලු ප්‍රජාවන් එකඟත්වයෙන් සහ සමගියෙන් යුතු ව සහජීවනයෙන් ජීවත්වන සමාජයක් ගොඩනැංවීම සඳහා, ජාතික සමගිය සහ ප්‍රතිසන්ධානය සඳහා වන කාර්යාලයක් පිහිටුවීම ජාතික වැදගත්කමක් සහිත කාරණාවක් බවට පත්ව ඇති හෙයින් ද;

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

1. මේ පනත 2024 අංක 1 දරන ජාතික සමගිය සහ ප්‍රතිසන්ධානය සඳහා වන කාර්යාලය පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය

2. පනතේ අරමුණු- පනතේ අරමුණු

(අ) ශ්‍රී ලංකාවේ සියලු ම තැනැත්තන් අතර ජාතික සමගිය, ප්‍රතිසන්ධානය සහ සාමකාමී සහජීවනය ප්‍රවර්ධනය කිරීම සහ පෝෂණය කිරීම;

(ආ) ප්‍රතිසන්ධානය සහ සහජීවනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සකස් කර ආණ්ඩුවට නිර්දේශ කිරීම;

(ඇ) සියලු ප්‍රජාවන් අතර අවබෝධය, එකඟත්වය සහ සමගිය ගොඩනැගීම සඳහා උපකාර වන ජාතික සමගිය

හා ප්‍රතිසන්ධානයට අදාළ ප්‍රතිපත්ති සහ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සැලසීම;

(ඈ) විවිධ ප්‍රජාවන් තුළ සහ ඔවුන් අතර, ආතතීන් සහ ගැටුම් ඇති කරනු ලබන කාරණා විසඳීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග ආණ්ඩුව වෙත නිර්දේශ කිරීම;

(ඉ) සාමය සහ ජාතික සමගිය සඳහා වූ මූලපිරීම්වල ඒකාබද්ධභාවය සාක්ෂාත් කර ගැනීම සඳහා ප්‍රතිසන්ධානය සහ සහජීවනය පිළිබඳව කටයුතු කරනු ලබන උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ට සහාය ලබා දීම; සහ

(ඊ) ජාතික සමගිය සහ ප්‍රතිසන්ධානය සාක්ෂාත් කරගැනීමේ කාර්යය සඳහා යම් ලිඛිත නීතියක් යටතේ හෝ ආණ්ඩුවේ ප්‍රතිපත්තියක් යටතේ පිහිටුවනු ලැබ ඇති යම් ප්‍රතිසන්ධාන ප්‍රයත්නයක් විසින් කරනු ලබන යම් නිර්දේශයක් ක්‍රියාත්මක කිරීම සඳහා සහාය දැක්වීම සහ පහසුකම් සැලසීම,

විය යුතු ය.

I වන කොටස

## ජාතික සමගිය සහ ප්‍රතිසන්ධානය සඳහා වන කාර්යාලය පිහිටුවීම

ජාතික සමගිය සහ ප්‍රතිසන්ධානය සඳහා වන කාර්යාලය පිහිටුවීම

3. (1) (මෙහි මින් මතු "ප්‍රතිසන්ධාන කාර්යාලය" යනුවෙන් සඳහන් කරනු ලබන) "ජාතික සමගිය සහ ප්‍රතිසන්ධානය සඳහා වන කාර්යාලය" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන කාර්යාලයක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) ප්‍රතිසන්ධාන කාර්යාලය අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් සහිත සංස්ථාපිත මණ්ඩලයක් විය යුතු අතර, එහි සංස්ථාපිත නාමයෙන් එය විසින් ද එයට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකි ය.

(3) ප්‍රතිසන්ධාන කාර්යාලයේ ප්‍රධාන කාර්යාලය කොළඹ පිහිටා තිබිය යුතු අතර, ප්‍රතිසන්ධාන කාර්යාලය විසින් එහි කාර්යභාරය සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය යයි සලකනු ලැබිය හැකි ප්‍රාදේශීය කාර්යාල සංඛ්‍යාවක් කලින් කලට පිහිටුවනු ලැබිය හැකි ය.

ප්‍රතිසන්ධාන කාර්යාලය සංස්ථාපනය

**4.** (1) ප්‍රතිසන්ධාන කාර්යාලය-

(අ) අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයකුගේ නිලයට නොඅඩු නිලයක් දරන නිලධරයකු විය යුතු, අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන පරිදි ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන, නිල බලයෙන් පත් වන එක් සාමාජිකයකුගෙන්; සහ

(ආ) (මෙහි මින් මතු "පත් කළ සාමාජිකයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) (2) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව අමාත්‍යවරයා විසින් කරනු ලබන නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන වෙනත් සාමාජිකයන් දස දෙනකුගෙන්,

සමන්විත විය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් කරන ලද සාමාජිකයන් පත් කිරීම සඳහා නිර්දේශ සිදු කිරීමේ දී, අමාත්‍යවරයා විසින්-

(අ) ප්‍රතිසන්ධාන කාර්යාලයේ සංයුතිය මගින් ශ්‍රී ලාංකික සමාජයේ බහුත්ව ස්වභාවය පිළිඹිබු කරන බව සහතික කරන බවට;

(ආ) ප්‍රතිසන්ධාන කාර්යාලයේ සාමාජිකයන් ලෙස පත් කිරීමට නිර්දේශ කරනු ලැබ ඇති තැනැත්තන්, මානව හිමිකම් නීතිය, ජාත්‍යන්තර මානුෂීය නීතිය, ප්‍රතිසන්ධානය සහ සමාජ එකඟත්වය, ජාතික සමගිය, කළමනාකරණය, ව්‍යාපෘති සැලසුම්කරණය සහ ප්‍රාදේශීය සංවර්ධනය යන ක්ෂේත්‍ර එකක හෝ කිහිපයක විශිෂ්ටත්වය සහ පළපුරුද්ද ඇති තැනැත්තන් බව සහතික කරන බවට; සහ

(ඇ) ප්‍රතිසන්ධාන කාර්යාලයේ සාමාජිකයන් වශයෙන් පත් කිරීමට නිර්දේශ කර ඇති තැනැත්තන්, 5 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති යම් නුසුදුසුකමකට යටත් නොවන බව සහතික කරන බවට,

නිසි සැලකිල්ලක් දක්වනු ලැබිය යුතු ය.

(3) ජනාධිපතිවරයා විසින්, අමාත්‍යවරයාගේ නිර්දේශය මත, ප්‍රතිසන්ධාන කාර්යාලයේ සභාපති වශයෙන් එක් සාමාජිකයකු පත් කරනු ලැබිය යුතු ය.

ප්‍රතිසන්ධාන කාර්යාලයේ සාමාජිකයකු වීමට නුසුදුසුකම්

5. යම් තැනැත්තකු -

(අ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු, පළාත් සභා මන්ත්‍රීවරයකු හෝ යම් පළාත් පාලන ආයතනයක සභිකයකු වේ නම් හෝ වුවහොත්;

(ආ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන්නේ නම් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසියකු වීම අවසන් වුවහොත්;

(ඇ) නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් මගින් බුන්වත් පුද්ගලයකු බවට විනිශ්චය කරනු ලැබ ඇත්නම් හෝ බුන්වත්භාවයට පත්ව ඇත්නම්;

(ඈ) අමාත්‍යවරයාගේ නිර්දේශය මත ඇති කරගන්නා ලද ජනාධිපතිවරයාගේ මතය අනුව, එම සාමාජිකයාට ප්‍රතිසන්ධාන කාර්යාලයේ සාමාජිකයකු ලෙස තම කාර්ය ඉටු කිරීමේ දී බැඳියා පිළිගැටුමක් ඇති බවට තීරණය කර ඇත්නම් හෝ තීරණය කරනු ලබන්නේ නම්;

(ඉ) රෝගාතුර වීම හෝ වෙනත් යම් මානසික හෝ ශාරීරික අශක්නුතාවකට පත් වීම හේතුවෙන් ධුරයේ තවදුරටත් කටයුතු කිරීමට නුසුදුසු වන්නේ නම් හෝ නුසුදුසු බවට පත් වුවහොත්;

(ඊ) නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් සිහිවිකල් තැනැත්තකු බවට ප්‍රකාශයට පත් කරනු ලැබ ඇත්නම් හෝ ප්‍රකාශයට පත් කරනු ලබන්නේ නම්;

(ඌ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක යම් අධිකරණයක් මගින් පනවන ලද බන්ධනාගාරගත කිරීමේ දඬුවමක් විඳ ඇත්නම් හෝ විඳිමින් සිටී නම්; හෝ

(ඍ) ප්‍රතිසන්ධාන කාර්යාලයෙහි පූර්ව අනුමතය ලබා නොගෙන නොකඩවා එම කාර්යාලයේ රැස්වීම් තුනකට නොපැමිණ සිටියහොත්,

එම තැනැත්තා ප්‍රතිසන්ධාන කාර්යාලයේ සාමාජිකයකු ලෙස පත් කරනු ලැබීමට හෝ සාමාජිකයකු ලෙස තවදුරටත් කටයුතු කරගෙන යාමට නුසුදුස්සකු විය යුතු ය.

පත්කළ සාමාජිකයන්ගේ ධුර කාලය

**6.** (1) ප්‍රතිසන්ධාන කාර්යාලයේ සෑම පත් කළ සාමාජිකයකු ම මිය යාමෙන්, ඉල්ලා අස්වීමෙන් හෝ ඉවත් කිරීමෙන් ධුරය කලින් හිස් කළහොත් මිස, පත් කළ දින සිට වසර තුනක කාලසීමාවක් සඳහා ධුරය දරනු ලැබිය යුතු අතර, ඒ සාමාජිකයා ඉවත් කරනු ලැබුවහොත් මිස, අනුගාමී හෝ අන්‍යාකාරයකින් වන එක් වැඩිදුර කාලසීමාවකට නොවැඩි කාලසීමාවක් සඳහා නැවත පත් කිරීමට සුදුස්සකු විය යුතු ය.

(2) මේ වගන්තියේ කාර්යය සඳහා, සාමාජිකයකු, වැඩබලන සාමාජිකයකු වශයෙන් පත් කරනු ලබන කාලසීමාව, මේ වගන්තියේ අර්ථානුකූලව "ධුර කාලය" වශයෙන් සලකනු නොලැබිය යුතු ය.

පත්කළ සාමාජිකයන් ඉවත් කිරීම සහ ඉල්ලා අස්වීම

**7.** (1) ප්‍රතිසන්ධාන කාර්යාලයේ පත් කළ සාමාජිකයකුගේ ධුරය-

(අ) ඒ සාමාජිකයා මිය යාම මත;

(ආ) ඒ සාමාජිකයා ජනාධිපතිවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් ඒ ධුරයෙන් ඉල්ලා අස්වීම මත;

(ඇ) 5 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති යම් හේතුවක් මත ඒ සාමාජිකයා ධුරයෙන් ඉවත් කිරීම මත; හෝ

(ඈ) ඒ සාමාජිකයාගේ ධුර කාලය අවසන් වීම මත,

හිස්වනු ලැබිය යුතු ය.

(2) ප්‍රතිසන්ධාන කාර්යාලයේ සාමාජිකයකු, ප්‍රතිසන්ධාන කාර්යාලයේ සාමාජිකයකු වීම සඳහා 5 වන වගන්තිය යටතේ නුසුදුසු බවට පත් වුවහොත්, ජනාධිපතිවරයා විසින් ඒ තැනැත්තා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(3) සභාපති විසින්, ජනාධිපතිවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් සභාපති ධුරයෙන් ඉල්ලා අස්වනු ලැබිය හැකි ය.

(4) (1) වන සහ (2) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව, සභාපතිගේ ධුර කාලය, ප්‍රතිසන්ධාන කාර්යාලයේ සාමාජිකත්ව කාලසීමාව විය යුතු ය.

(5) (අ) රෝගාතුර වීම හේතුවෙන් හෝ වෙනත් අශක්නුතාවක් හේතුවෙන් හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හේතුවෙන් හෝ වෙනත් යම් හේතුවක් මත ප්‍රතිසන්ධාන කාර්යාලයේ සභාපතිට තම ධුරයේ කාර්ය ඉටු කිරීමට තාවකාලිකව නොහැකි වන්නේ නම්, ජනාධිපතිවරයා විසින් 4 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, සභාපති වශයෙන් කටයුතු කිරීම සඳහා ප්‍රතිසන්ධාන කාර්යාලයේ වෙනත් යම් සාමාජිකයකු පත් කරනු ලැබිය හැකි ය.

(ආ) රෝගාතුර වීම හේතුවෙන් හෝ වෙනත් අශක්නුතාවක් හේතුවෙන් හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හේතුවෙන් හෝ වෙනත් යම් හේතුවක් නිසා ප්‍රතිසන්ධාන කාර්යාලයේ සාමාජිකයකුට තම ධුරයේ කාර්ය ඉටු කිරීමට තාවකාලිකව නොහැකි වන්නේ නම්, ජනාධිපතිවරයා විසින් 4 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, ඒ කාලසීමාව තුළ දී ඒ සාමාජිකයා වෙනුවෙන් තාවකාලිකව කටයුතු කිරීම සඳහා වෙනත් යම් සුදුසුකම්ලත් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

(6) ප්‍රතිසන්ධාන කාර්යාලයේ සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් පැවතීමේ හෝ එහි යම් සාමාජිකයකු පත් කිරීමෙහිලා යම් දෝෂයක් පැවතීමේ හේතුව නිසා ම පමණක් ප්‍රතිසන්ධාන කාර්යාලයේ කිසිදු ක්‍රියාවක් හෝ කටයුත්තක් අවලංගු වන බවට සලකනු නොලැබිය යුතු ය.

ප්‍රතිසන්ධාන කාර්යාලයේ ගණපූරණය සහ රැස්වීම්

**8.** (1) සභාපති විසින් ප්‍රතිසන්ධාන කාර්යාලයේ සියලු රැස්වීම්වල මුලසුන දරනු ලැබිය යුතු ය. ප්‍රතිසන්ධාන කාර්යාලයේ යම් රැස්වීමකට සභාපති නොපැමිණි අවස්ථාවක දී, ඒ රැස්වීමට පැමිණ සිටින සාමාජිකයන් විසින්, ප්‍රතිසන්ධාන කාර්යාලයේ සාමාජිකයන් අතරින් එක් සාමාජිකයකු ඒ රැස්වීමේ මුලසුන දැරීම සඳහා තෝරා පත් කර ගනු ලැබිය යුතු ය.

(2) සභාපතිට හෝ ප්‍රතිසන්ධාන කාර්යාලයේ එවැනි යම් රැස්වීමක මුලසුන දරන සාමාජිකයාට ඔහුගේ ඡන්දයට අමතරව තීරක ඡන්දයක් තිබිය යුතු ය.

(3) ප්‍රතිසන්ධාන කාර්යාලයේ රැස්වීම්වල ගණපූරණය සාමාජිකයන් පස්දෙනෙකු විය යුතු ය.

(4) මේ පනතේ වෙනත් විධිවිධානවලට යටත්ව, ප්‍රතිසන්ධාන කාර්යාලයේ රැස්වීම් පැවැත්වීමට සහ ඒ රැස්වීම්වල දී කටයුතු කිරීමට අදාළ කාර්ය පටිපාටිය නියාමනය කිරීමට ප්‍රතිසන්ධාන කාර්යාලය විසින් රීති සාදනු ලැබිය හැකි ය.

## II වන කොටස

## ප්‍රතිසන්ධාන කාර්යාලයේ කාර්යභාරය, බලතල, කාර්ය සහ කර්තව්‍ය

ප්‍රතිසන්ධාන කාර්යාලයේ කාර්යභාරය

**9.** ප්‍රතිසන්ධාන කාර්යාලයට-

(අ) ශ්‍රී ලංකාව තුළ ජාතික සමගිය, ප්‍රතිසන්ධානය සහ කල්පවත්නා සාමය සාක්ෂාත් කරගැනීම සඳහා ආණ්ඩුව සහ අදාළ බලධාරීන් වෙත නිර්දේශ ඉදිරිපත් කිරීමේ;

(ආ) ප්‍රතිසන්ධානය සහ සහජීවනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සහ ජාතික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමේ;

(ඇ) ශ්‍රී ලංකාව තුළ ජාතික සමගිය සහ ප්‍රතිසන්ධානය ප්‍රවර්ධනය කිරීම සඳහා වන වැඩසටහන් සඳහා

පහසුකම් සැලසීමේ සහ ඒවා ක්‍රියාත්මක කිරීමේ සහ එම වැඩසටහන් ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීමේ; සහ

(ඈ) ජාතික සමගිය කෙරෙහි අහිතකර බලපෑම් ඇති කරනු ලබන, විවිධ ප්‍රජාවන් තුළ සහ විවිධ ප්‍රජාවන් අතර, ආතතීන් සහ ගැටුම් ඇති කරනු ලබන කාරණා විසඳීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග ආණ්ඩුවට නිර්දේශ කිරීමේ,

කාර්යභාරය ඇත්තේ ය.

ප්‍රතිසන්ධාන කාර්යාලයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය

**10.** ප්‍රතිසන්ධාන කාර්යාලයට පහත දැක්වෙන බලතල, කාර්ය සහ කර්තව්‍ය තිබිය යුතු යː-

(අ) ශ්‍රී ලංකාව තුළ ජාතික සමගිය හා ප්‍රතිසන්ධානය ගොඩනැංවීමට අදාළ කාරණා සහ ප්‍රතිසන්ධාන කාර්යාලයේ කාර්යභාරයේ නිශ්චිතව දක්වා ඇති අනෙකුත් කාරණා සම්බන්ධයෙන් ආණ්ඩුව සහ අදාළ බලධාරීන් වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම;

(ආ) ප්‍රතිසන්ධානය සහ සහජීවනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම සහ එය ක්‍රියාත්මක කිරීම සඳහා සහාය වීම;

(ඇ) මේ පනතේ උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති වැඩසටහන්වලින් සමන්විත ප්‍රතිසන්ධානය සහ සහජීවනය පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම සහ එය ක්‍රියාත්මක කිරීම;

(ඈ) ජනවාර්ගික, ආගමික, භාෂාමය, සමාජීය, දේශපාලනික සහ ආර්ථික සාධක හේතුවෙන් ශ්‍රී ලාංකීය සමාජයේ සමාජ ස්ථරයන් තුළ පීඩාවට පත් වූ තැනැත්තන් හෝ පුද්ගල කණ්ඩායම් හඳුනාගැනීම;

(ඉ) ප්‍රතිසන්ධානය හා සහජීවනය පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්ම තුළ (ඈ) ඡේදයේ සඳහන් තැනැත්තන් හෝ පුද්ගල කණ්ඩායම් සඳහා සහනදායී වැඩසටහන් සංවර්ධනය කිරීම;

(ඊ) ප්‍රතිසන්ධානය සඳහා දරන ප්‍රයත්නයන් ඉදිරියට ගෙන යාම සහ ජාතික සමගිය ශක්තිමත් කිරීම සහ අභ්‍යන්තරව අවතැන් වූ ජනතාවගේ නැවත පැමිණීම සහ නැවත පදිංචි කිරීම සහ අදාළ තැනැත්තන් පුනරුත්ථාපනය කර නැවත සමාජගත කිරීම වැනි පශ්චාත් ගැටුම් සම්බන්ධ කාරණා සඳහා විසඳුම් සෙවීම;

(උ) ප්‍රතිසන්ධානය සහ සහජීවනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සහ ජාතික ක්‍රියාකාරී සැලැස්ම පිළිබඳව මහජනයා දැනුවත් කිරීමේ වැඩසටහන් සහ අධ්‍යාපනික වැඩසටහන් දියත් කිරීම;

(ඌ) ජාතික ප්‍රතිසන්ධානය සහ සහජීවනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියේ අර්ථ දක්වා ඇති වටිනාකම් වාර්ෂික කාර්යය සැලසුම් මගින් ආණ්ඩුවේ ආයතන සහ දැනට පවත්නා ජාතික මුලපිරීම් තුළ ප්‍රධාන ප්‍රවාහයකට ගෙන ඒම;

(එ) ජාතික ඒකාබද්ධතාවයට ඇති බාධක හඳුනාගැනීම සහ අදාළ උනන්දුවක් දක්වන පාර්ශ්වයන් සමඟ සාකච්ඡා කිරීම සහ එකඟතාවයට පැමිණීම මත පදනම්ව සුදුසු ක්‍රියාමාර්ග ගැනීම;

(ඒ) ප්‍රතිසන්ධානය සහ සාමය ගොඩනැගීමට අදාළ කාරණා සම්බන්ධයෙන් කටයුතු කරනු ලබන අමාත්‍යාංශ, ආණ්ඩුවේ දෙපාර්තමේන්තු සහ වෙනත් ආයතන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම;

(ඔ) ජාතික ඒකාබද්ධතාවය හා ප්‍රතිසන්ධානය සම්බන්ධයෙන් දැනට ක්‍රියාත්මක වෙමින් පවත්නා සහ ක්‍රියාත්මක කිරීමට නියමිත විවිධ උපායමාර්ග සමාලෝචනය කිරීම සහ එම උපායමාර්ග ක්‍රියාත්මක කිරීමේ ගැටලු සමථයකට පත් කිරීමට සහාය වීම;

(ඕ) ජාතික සමගිය, ප්‍රතිසන්ධානය, සහජීවනය සහ තිරසර සාමය ගොඩනැගීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති සහ ක්‍රියාමාර්ග පිළිබඳව අදාළ උනන්දුවක් දක්වන පාර්ශ්වයන් විමසීම සඳහා රජයට සහ වෙනත් අදාළ බලධාරීන්ට නිර්දේශ ඉදිරිපත් කිරීම;

(ක) (i) ජාතික ඒකාබද්ධතාවය, ප්‍රතිසන්ධානය සහ සහජීවනය සහ ජාතික එකඟත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා වැඩසටහන් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සහ එම වැඩසටහන් දිස්ත්‍රික් මට්ටමින් සංවර්ධන සැලසුම්වලට ඒකාබද්ධ කිරීම සඳහා;

(ii) ජාතික සමගිය සහ ප්‍රතිසන්ධානය සාක්ෂාත් කරගැනීමේ කාර්ය සඳහා යම් ලිඛිත නීතියක් යටතේ හෝ ආණ්ඩුවේ යම් ප්‍රතිපත්තියක් යටතේ පිහිටුවන ලද යම් ප්‍රතිසන්ධාන ප්‍රයත්නයක් මගින් කරන ලද නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා;

(iii) සාමය ගොඩනැංවීමේ සහ ප්‍රතිසන්ධාන ක්‍රියාවලිය තුළ උද්ගත විය හැකි ගැටලු සඳහා සුදුසු විසඳුම් යෝජනා කිරීම මගින් එම ගැටලු නිරාකරණය කිරීම සඳහා; සහ

(iv) මේ පනත යටතේ පවත්වනු ලබන, ජාතික සමගිය හා ප්‍රතිසන්ධානය පිළිබඳ වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අරමුදල් සෙවීම සඳහා,

අදාළ බලධාරීන්ට සහාය වීම;

(ග) පනතේ අරමුණු ප්‍රවර්ධනය කිරීමේ අදහසින් අනෙකුත් දේශීය හා විදේශීය ආයතන, සංවර්ධන හවුල්කරුවන් සහ සිවිල් සමාජය සමඟ සම්බන්ධතා පවත්වාගෙන යාම සහ සම්බන්ධීකරණය කිරීම;

(ඞ) ප්‍රජා මූලික සංවිධාන ඇතුළු දේශීය සංවිධාන මගින් මෙහෙයවනු ලබන සාමය හා ප්‍රතිසන්ධාන වැඩසටහන්වලට සහාය වීම, මඟපෙන්වීම සහ ඒවාට පහසුකම් සැපයීම;

(ඡ) පරිපාලනය ඇතුළුව ප්‍රතිසන්ධාන කාර්යාලයේ ඵලදායී ක්‍රියාකාරීත්වය සහතික කිරීම සඳහා රීති සෑදීම;

(ට) ප්‍රතිසන්ධාන කාර්යාලයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ කිරීමට අදාළව එහි කාර්ය මණ්ඩලය විසින් අනුගමනය කළ යුතු ස්ත්‍රී පුරුෂභාවයට සහ ළමයින්ට ප්‍රතිචාරාත්මක ප්‍රතිපත්ති ද ඇතුළත් රීති සහ මාර්ගෝපදේශ කලින් කලට සකස් කිරීම සහ නිකුත් කිරීම;

(ඩ) ප්‍රතිසන්ධාන කාර්යාලයේ නිලධරයන් සහ සේවා නියුක්තයන් පත් කිරීම, සේවයේ නියුක්ත කරවීම සහ ඉවත් කිරීම සහ ඒ නිලධරයන්ගේ සහ සේවා නියුක්තයන්ගේ විනය පාලනය ක්‍රියාත්මක කිරීම;

(ණ) ප්‍රතිසන්ධාන කාර්යාලය සඳහා රජයේ නිලධරයන් පත් කරන ලෙස ඉල්ලීම; සහ

(ත) කමිටු පත් කිරීම සහ මේ පනතේ නිශ්චිතව සඳහන් කර ඇති යම් ඒකකයකට හෝ අංශයකට අමතරව ප්‍රතිසන්ධාන කාර්යාලයේ ඵලදායී පරිපාලනය සහ ක්‍රියාකාරීත්වය සඳහා අවශ්‍ය කරනු ලබන අංශ සහ ඒකක පිහිටුවීම සහ ඒ කමිටු, අංශ සහ ඒකකවලට ඒ බලතල සහ කර්තව්‍යයන් පැවරීම.

## III වන කොටස

### ලේකම් කාර්යාලය

ලේකම් කාර්යාලය

**11.** (1) ප්‍රතිසන්ධාන කාර්යාලයේ කටයුතු පරිපාලනය කිරීමේ වගකීම භාරව සිටිය යුතු ලේකම් කාර්යාලයක් ප්‍රතිසන්ධාන කාර්යාලයට තිබිය යුතු ය.

(2) ප්‍රතිසන්ධාන කාර්යාලය විසින්, ජාතික සමගිය හා ප්‍රතිසන්ධාන ක්ෂේත්‍රයෙහි සුදුසුකම් සහ පළපුරුද්ද ඇති තැනැත්තකු අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස පත් කළ යුතු අතර අධ්‍යක්ෂ ජනරාල්වරයා ප්‍රතිසන්ධාන කාර්යාලයේ ප්‍රධාන විධායක නිලධරයා විය යුතු ය.

(3) ප්‍රතිසන්ධාන කාර්යාලයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, ඉටු කිරීමේ දී හා කිරීමේ දී ප්‍රතිසන්ධාන කාර්යාලයට සහාය වීම සඳහා අවශ්‍ය විය හැකි වෙනත් යම් නිලධරයන් සහ සේවකයන් ප්‍රතිසන්ධාන කාර්යාලය විසින් පත් කරනු ලැබිය හැකි ය.

ප්‍රතිසන්ධාන කාර්යාලය සඳහා රාජ්‍ය නිලධරයන් පත් කිරීම

**12.** (1) ප්‍රතිසන්ධාන කාර්යාලයේ ඉල්ලීම මත, රාජ්‍ය සේවයේ යම් නිලධරයකු, ඒ නිලධරයාගේ සහ රාජ්‍ය පරිපාලන විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ කැමැත්ත ඇතිව ප්‍රතිසන්ධාන කාර්යාලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් කාලසීමාවක් සඳහා ප්‍රතිසන්ධාන කාර්යාලයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කිරීම හෝ එම කැමැත්ත ඇතිව ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව ම පත් කිරීම සිදු කරනු ලැබිය හැකි ය.

(2) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු ප්‍රතිසන්ධාන කාර්යාලයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලබන අවස්ථාවක දී, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ඒ නිලධරයාට සහ ඒ නිලධරයා සම්බන්ධයෙන් අදාළ කර ගනු ලැබිය යුතු ය.

(3) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු ප්‍රතිසන්ධාන කාර්යාලයේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලබන අවස්ථාවක දී, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ඒ නිලධරයාට සහ ඒ නිලධරයා සම්බන්ධයෙන් අදාළ කර ගනු ලැබිය යුතු ය.

## IV වන කොටස

### මුදල් සහ වාර්තා කිරීම

මුදල්

**13.** මේ පනත යටතේ ප්‍රතිසන්ධාන කාර්යාලයට පැවරී ඇති කර්තව්‍ය ඉටු කිරීම සඳහා ඒ කාර්යාලයට හැකි වන පරිදි ප්‍රමාණවත් අරමුදල් රජය විසින් ඒ කාර්යාලයට ලබා දිය යුතු ය. ඒ අරමුදල් ඒකාබද්ධ අරමුදලට වැය බරක් විය යුතු ය.

14. ප්‍රතිසන්ධාන කාර්යාලයේ සාමාජිකයන්ගේ වැටුප් පාර්ලිමේන්තුව විසින් තීරණය කළ යුතු අතර ඒකාබද්ධ අරමුදලට වැය බරක් විය යුතු ය. එම සාමාජිකයන් ධුර දරන කාලය ඇතුළත ඒ වැටුප් අඩු නොකළ යුතු ය.

ප්‍රතිසන්ධාන කාර්යාලයේ සාමාජිකයන්ගේ වැටුප්

15. ප්‍රතිසන්ධාන කාර්යාලය විසින්-

ප්‍රතිසන්ධාන කාර්යාලය අරමුදල් උපයා ගැනීම

(අ) ශ්‍රී ලංකාවෙන් ලැබෙන ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග ලබා ගැනීමෙන්; සහ

(ආ) සිය කාර්යභාරය ඉටු කිරීම සඳහා ශ්‍රී ලංකාවෙන් බැහැර සිට ලැබෙන ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග ලබා ගැනීමෙන්,

එහි අරමුදල් උපයා ගනු ලැබිය හැකි යඃ

එසේ වුව ද, (ආ) ඡේදය යටතේ වූ අරමුදල් විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හරහා ලබාගත යුතු ය.

16. (1) ප්‍රතිසන්ධාන කාර්යාලයේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

මුදල් වර්ෂය

(2) ප්‍රතිසන්ධාන කාර්යාලයේ ආදායම හා වියදම පිළිබඳ, වත්කම් හා බැරකම් පිළිබඳව නිසි පරිදි ගිණුම් තැබීමට එම කාර්යාලය විසින් කටයුතු සැලැස්විය යුතු ය.

(3) ප්‍රතිසන්ධාන කාර්යාලයේ ගිණුම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාව ප්‍රකාරව විගණකාධිපතිවරයා විසින් විගණනය කළ යුතු ය.

17. ප්‍රතිසන්ධාන කාර්යාලය විසින් ස්වකීය විගණනය කරන ලද ගිණුම් ඇතුළු වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු අතර ඒ වාර්තා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමෙන් මාසයක කාලයක් ඇතුළත ඒවා ප්‍රසිද්ධ කිරීමට කටයුතු සැලැස්විය යුතු ය.

වාර්තා කිරීම

## V වන කොටස

### සාමාන්‍ය විධිවිධාන

වැරදි

**18.** (1) (අ) මේ පනතේ බලය පවරනු ලැබ ඇති යම් තැනැත්තකු විසින් ඒ තැනැත්තා වෙත පවරනු ලැබූ බලතල ක්‍රියාත්මක කිරීමේ දී ප්‍රතිරෝධය දක්වනු ලබන හෝ බාධා කරනු ලබන;

(ආ) ප්‍රතිසන්ධාන කාර්යාලය විසින් ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, ඉටුකිරීමේ දී සහ කිරීමේ දී ඊට අයුතු ලෙස බාධා කරනු ලබන හෝ අවහිර කරනු ලබන; හෝ

(ඇ) ප්‍රතිසන්ධාන කාර්යාලය වෙත හිතාමතා අසත්‍ය තොරතුරු ලබා දෙන,

යම් තැනැත්තකු විසින් ප්‍රතිසන්ධාන කාර්යාලයේ අධිකාරී බලයට එරෙහිව අපහාස කිරීමේ වරදක් සිදු කරනු ලබන්නේ ය.

(2) යම් තැනැත්තකු විසින්, ප්‍රතිසන්ධාන කාර්යාලයේ අධිකාරී බලයට එරෙහිව අපහාස කිරීමේ වරද සිදු කර ඇති බවට විශ්වාස කිරීමට සාධාරණ හේතු ප්‍රතිසන්ධාන කාර්යාලය සතු වන විට දී, ප්‍රතිසන්ධාන කාර්යාලය විසින් ඒ කරුණු අභියාචනාධිකරණයට වාර්තා කළ යුතු ය. ප්‍රතිසන්ධාන කාර්යාලයේ අධිකාරී බලයට විරුද්ධව සිදු කරන ලද සෑම අපහාස කිරීමේ වරදක් ම අභියාචනාධිකරණයට එරෙහිව සිදු කරන ලද අපහාස කිරීමේ වරදක් මෙන් සලකා අභියාචනාධිකරණය විසින් ඒ සඳහා දඬුවම් පැමිණ විය යුතු ය.

නඩුවලින් ආරක්ෂා වීම

**19.** (1) (අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 126 වන හෝ 140 වන ව්‍යවස්ථාව යටතේ වූ නීති කෘත්‍යවල දී හැර, ප්‍රතිසන්ධාන කාර්යාලයේ හෝ එහි යම් සාමාජිකයකුගේ, නිලධරයකුගේ හෝ සේවකයකුගේ නියමයක්, තීරණයක්, ක්‍රියාවක් හෝ නොකර හැරීමක් යම් නීති කෘත්‍යයක දී හෝ යම් අධිකරණයක දී ප්‍රශ්න කරනු නොලැබිය යුතු ය.

(ආ) ප්‍රතිසන්ධාන කාර්යාලයේ හෝ එහි යම් සාමාජිකයකුගේ, නිලධරයකුගේ හෝ සේවකයකුගේ යම් නියමයකට, තීරණයකට, ක්‍රියාවකට හෝ නොකර හැරීමකට අදාළව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 140 වන ව්‍යවස්ථාව මගින් අභියාචනාධිකරණය වෙත පැවරී ඇති රිට් අධිකරණ බලය අභියාචනාධිකරණය විසින් නොව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ක්‍රියාත්මක කළ යුතු ය.

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධාන සලස්වා ඇති අවස්ථාවලට අමතරව-

(අ) ප්‍රතිසන්ධාන කාර්යාලයේ අධිකාරී බලයට එරෙහිව අපහාස කිරීම සම්බන්ධයෙන් හැර, ප්‍රතිසන්ධාන කාර්යාලයේ යම් සාමාජිකයකු හෝ ප්‍රතිසන්ධාන කාර්යාලයට සහාය වීමට පත් කළ යම් නිලධරයකු හෝ සේවකයකු විසින් සද්භාවයෙන් කරන ලද නැතහොත් නොකර හරින ලද යම් ක්‍රියාවක් සඳහා එම සාමාජිකයාට, ඒ නිලධරයාට හෝ සේවකයාට එරෙහිව කිසිදු සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය;

(ආ) මේ පනත යටතේ ප්‍රතිසන්ධාන කාර්යාලය විසින් සද්භාවයෙන් කරන ලද යම් වාර්තාවක් සම්බන්ධයෙන් ප්‍රතිසන්ධාන කාර්යාලයේ යම් සාමාජිකයකුට එරෙහිව හෝ ඒ වාර්තාව පිළිබඳ සත්‍ය විස්තරයක් යම් තැනැත්තකු විසින් පළකිරීම සම්බන්ධයෙන් එම තැනැත්තාට එරෙහිව සිවිල් හෝ අපරාධ නඩු පවරනු නොලැබිය යුතු ය; සහ

(ඇ) ප්‍රතිසන්ධාන කාර්යාලයට යම් තැනැත්තකු සද්භාවයෙන් සාක්ෂි හෝ ලේඛන සැපයීමේ ප්‍රතිඵලයක් ලෙස ඒ තැනැත්තාට එරෙහිව කිසිදු සිවිල් හෝ අපරාධ නඩුවක් පැවරීම නොකළ යුතු අතර ඒ සම්බන්ධයෙන් පරිපාලනමය ක්‍රියාමාර්ගයක් නොගත යුතු ය.

**20.** (1) ප්‍රතිසන්ධාන කාර්යාලය විසින් මේ පනත යටතේ රීති සාදනු ලැබීමට අවශ්‍ය කරුණු සඳහා රීති සාදනු ලැබිය හැකි ය. රීති

(2) මේ පනත යටතේ සාදන ලද සෑම රීතියක් ම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, මාස තුනක් නොඉක්මවන්නා වූ සාධාරණ කාලසීමාවක් ඇතුළත ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

සාමාජිකයන් ආදිය රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු බව

**21.** ප්‍රතිසන්ධාන කාර්යාලයේ සාමාජිකයන් (මේ පනත යටතේ සිය කර්තව්‍ය ඉටු කිරීමේ සීමිත කාර්යය සඳහා) සහ එහි නිලධරයන් සහ සේවකයන් (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ, 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ සහ (14 වන අධිකාරය වූ) සාක්ෂි ආඥාපනතේ කාර්යය සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

ප්‍රතිසන්ධාන කාර්යාලය උපලේඛනගත ආයතනයක් විය යුතු බව

**22.** ප්‍රතිසන්ධාන කාර්යාලය, 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම්ගත යුතු ය.

බලතල පැවරීම

**23.** (1) ප්‍රතිසන්ධාන කාර්යාලය විසින් එහි බලතල සහ කර්තව්‍ය කිසිවක් එහි අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ වෙනත් යම් සාමාජිකයකු හෝ නිලධරයකු වෙත පවරනු ලැබිය හැකි ය.

(2) ප්‍රතිසන්ධාන කාර්යාලයේ බලතල හෝ කර්තව්‍ය කිසිවක් පවරනු ලැබ ඇති අධ්‍යක්ෂ ජනරාල්වරයා, සාමාජිකයා හෝ නිලධරයා විසින් ප්‍රතිසන්ධාන කාර්යාලයේ සාමාන්‍ය හෝ විශේෂ විධානයන්ට යටත්ව එකී බලතල සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම කළ යුතු ය.

අර්ථ නිරූපණය

**24.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතේ-

"අමාත්‍යවරයා" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන හෝ 45 වන ව්‍යවස්ථාව යටතේ ප්‍රතිසන්ධාන කාර්යාලය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා අදහස් වේ; සහ

"ප්‍රජා මූලික සංවිධාන" යන්නෙන්, නිශ්චිත ප්‍රජාවක් හෝ ප්‍රදේශයක් තුළ බිම් මට්ටමෙන් ක්‍රියාත්මක වන ලාභ නොලබන හෝ රාජ්‍ය නොවන සංවිධානයක් අදහස් වේ.

**25.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

උපලේඛනය

(10(ඇ) වන වගන්තිය)

**ප්‍රතිසන්ධානය සහ සහජීවනය පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලසුමේ අන්තර්ගත විය යුතු වැඩසටහන්**

1. සියලු ප්‍රජාවන් අතර දැනුවත්භාවය, සාමය සහ සමගිය ගොඩනංවනු ලබන ප්‍රතිසන්ධානය සහ සහජීවනය සහතික කිරීමේ වැඩසටහන් සහ පසු විපරම් වැඩසටහන්.

2. නීතියේ ආධිපත්‍ය, මූලික අයිතිවාසිකම්, නිදහස, සමාජ බැඳීම්, අන්‍යෝන්‍ය ගරුත්වය, වෙනස් කොට නොසැලකීම, සමානාත්මතාවය සහ විවිධත්වය ගරු කරන සමාජයක් නිර්මාණය කිරීම සඳහා බහුපාර්ශ්වකරුවන්ගේ ප්‍රයත්නය ප්‍රවර්ධනය කිරීම සහ උත්ප්‍රේරණය කිරීමේ වැඩසටහන්.

3. සංවාද ප්‍රවර්ධනය කිරීම, ප්‍රතිසන්ධානය සඳහා සම්මුතිය ගොඩනැංවීම සහ උද්ගත වෙමින් පවතින ගැටලු සඳහා පූර්ව අනතුරු ඇඟවීම් සහ ප්‍රතිචාර දැක්වීම සඳහා ප්‍රාදේශීය මට්ටමේ සිට ජාතික මට්ටම දක්වා සැලසුම් කර ස්ථාපිත කරනු ලබන සහ සහසම්බන්ධ ජාල යාන්ත්‍රණයක් පිහිටුවීමේ වැඩසටහන්.

4. පාසල්, රජයේ සහ පෞද්ගලික විශ්වවිද්‍යාල යන දෙවර්ගය ම, තෘතීය සහ වෘත්තීමය අධ්‍යාපන ආයතන ඇතුළුව අධ්‍යාපන පද්ධතිය තුළ ප්‍රතිසන්ධානය සහ සමාජ ඒකාබද්ධතාව ප්‍රවර්ධනය කිරීම සඳහා පාලනය, ප්‍රතිපත්ති සහ විෂය මාලා ශක්තිමත් කිරීමේ වැඩසටහන්.

5. අගතියට පත් වූ ප්‍රජාවන් අතර ප්‍රතිසන්ධානය පෝෂණය කිරීම, ශක්තිමත් කිරීම සඳහා සම්බන්ධීකරණය, තක්සේරු කිරීම, අධීක්ෂණය කිරීම සහ ඇගයීම ඇතුළු මනෝ සමාජයීය රැකවරණය සැපයීමේ සහ ආධාරක පද්ධතිය සැකසීමේ වැඩසටහන්.

6. අදාළ අමාත්‍යාංශ සහ රජයේ දෙපාර්තමේන්තු සහ ආයතන විමසා ප්‍රචණ්ඩ අන්තවාදය වළක්වා ගැනීම සඳහා ජාතික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමේ වැඩසටහන්.

7. විවිධ ප්‍රජාවන් අතර පැවති ආතතිය සහ ගැටුම් සඳහා හේතු වන ගැටලු විසඳීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව ආණ්ඩුවට නිර්දේශ ඉදිරිපත් කිරීමේ සහ එම ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමේ වැඩසටහන් සහ පසු විපරම් වැඩසටහන්.

8. සමාජ ඒකාබද්ධතාවය, අධ්‍යාපනය, ගැටුම් පරිවර්තනය, මනෝ සමාජයීය ආධාරක ව්‍යාපෘති, කලාව සහ සංස්කෘතිය, දැනුවත්භාවය ඇති කිරීම සහ සමාජගත කිරීම, සමස්ත දිස්ත්‍රික් සංවර්ධන සහ ප්‍රාදේශීය ආර්ථික සංවර්ධන සැලසුම් යටතේ වන ආර්ථික සම්බන්ධීකරණ වැඩසටහන්, කාන්තාවන් සහ තරුණයන් ඒ වැඩසටහන්වලට ඒකාබද්ධ කරගැනීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු වන ජීවනෝපාය සංවර්ධන සැලසුම් කෙරෙහි අවධානය යොමු කරන ව්‍යාපෘති සහ වැඩසටහන් සකස් කිරීමේ වැඩසටහන්.

පාර්ලිමේන්තුවේ සිංහල පනත්, අංක 118, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08,
රජයේ මුද්‍රණාලයේ පිහිටි "ප්‍රකාශන පියස" හි දී මිල දී ගත හැකි ය.